**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.</u>**

## 01. සීනිමෝදර හෙරොයින් සහ අයිස් මත්ද්‍රව්‍ය වැටලීමට අදාල සැකකරුවෙකු අත්අඩංගුවට - තංගල්ල පොලිස් ස්ථානය.

2025.09.22 වන දින තංගල්ල පොලිස් වසමේ සීනිමෝදර ප්‍රදේශයේ අභිරහස් ලෙස මියගිය පුද්ගලයන් තිදෙනෙකු සම්බන්ධයෙන් ලද තොරතුරක් මත තංගල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් එම ස්ථානයට ගොස් සිදුකල පරීක්ෂාවේදී ඒ අසල නවතා තිබූ ලොරි රථ දෙකක් තුල තිබී හෙරොයින් කිලෝග්‍රෑම් 168 ග්‍රෑම් 760 ක් සහ අයිස් මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 326 ග්‍රෑම් 190 ක් සොයා ගෙන තිබුණි. එම අවස්ථාවේදී සිද්ධිය වූ ස්ථානයේ රැඳී සිටි පුද්ගලයෙකු කලබල වී එම ස්ථානයෙන් පලාගොස් තිබූ අතර ඔහු අත්අඩංගුවට ගැනීම සඳහා තංගල්ල පොලිසිය විමර්ශන ආරම්භ කර තිබුණි.

ඒ අනුව, මෙම සැකකරු සම්බන්ධයෙන් තංගල්ල ගරු මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කර 2025.09.26 වන දින සැකකරුගේ ගුවන් ගමන් තහනම් කරමින් නියෝගයක් ලබාගෙන ඇත. ඉහත අත්අඩංගුවට ගත් මත්ද්‍රව්‍ය හා ගිනි අවි 06 ක් මාවැල්ල මුහුදු තීරයෙන් ගොඩබිමට රැගෙන පැමිණීමත්, මියගිය තිදෙනා සමඟ එම මත්ද්‍රව්‍ය මාවැල්ල සිට සීනිමෝදර නිවස දක්වා ප්‍රවාහනය කිරීමටත් සම්බන්ධ ප්‍රධාන සැකකරු ඉහත පලාගිය සැකකරු බවත්, මියගිය තිදෙනා හට පානය කිරීම සඳහා මත්පැන් රැගෙන පැමිණ ඇත්තේද මොහු බවට හඳුනාගෙන තිබුණි.

මෙම සැකකරු 2025.09.22 වන දින සිට පදිංචි ප්‍රදේශය අතහැර සැඟවී සිට 2025.11.26 වන දින නීතිඥ සහය ඇතිව තංගල්ල ගරු මහේස්ත්‍රාත් අධිකරණයට භාර වී ඇත. මෙම මත්ද්‍රව්‍ය ජාවාරම මෙහෙයවනු ලැබූ ප්‍රධාන සැකකරු මොහු බවත් මියගිය තිදෙනා සහ වාහන මොහු විසින් රැගෙන පැමිණ ඇති බවත් දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

**සැකකරු වයස අවුරුදු 32 ක් වන හත්බෝධිය, බෙලිඅත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු සම්බන්ධව වැඩිදුර විමර්ශන සිදුකිරීම සඳහා තංගල්ල ගරු මහේස්ත්‍රාත් අධිකරණයෙන් දින 07 ක් රැඳවුම් නියෝග ලබාගෙන ඇත. තංගල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 02. මනුෂ්‍ය ඝාතනයක් - පූඬළුඔය පොලිස් වසම.

2025.11.26 වන දින සවස් කාලයේ පූඬළුඔය පොලිස් වසමේ නියන්ගන්දර, මැද්දේතැන්නවත්ත ප්‍රදේශයේදී සතුන් දඩයම් කිරීම සඳහා යොදවා තිබූ අනවසර විදුලි රැහැනකින් විදුලි සැර වැදුනු පුද්ගලයෙකු කොත්මලේ රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇති බවට පූඬළුඔය පොලිස් ස්ථානය වෙත ලද පණිවුඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 49 ක් වූ නියම්ගන්දර, කොත්මලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු තවත් පුද්ගලයින් තිදෙනෙකු සමඟ ඉහත ප්‍රදේශයේ ගමන් කරමින් සිටියදී මෙසේ විදුලි සැර වැදී ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත. මෘත ශරීරය කොත්මලේ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. විදුලි රැහැන් ඇදින ලද සැකකරු අත්අඩංගුවට ගෙන ඇති අතර පූඬළුඔය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**